# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/16 - 2012 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2012.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම, නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වහා අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම අදාළ කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 21 - කොම්පඤ්ඤවීදිය දරන කොට්ඨාසය තුළ පිහිටි, බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් මහතා විසින් මැන පිළියෙල කරන ලද 2012.01.27 දිනැති අංක 1916 දරන සැලැස්මේ කැබලි අංක 8 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් අක්. 1, රූඩ්. 0, පර්. 4.35 (හෙක්. 0.4157) ක් පමණ වන පහත සඳහන් නම් වලින්, ප්‍රමාණයන්ගෙන් හා මායිම් වලින් යුක්ත වූ ඉඩම් කොටස (01)

| | | |
|---|---|---|
| කැබලි අංක 08 | : | වරිපනම් අංක නොදනී |
| ප්‍රමාණය | : | අක්. 01, රූඩ්. 00, පර්. 04.35(හෙක්. 0.4157) |
| උතුරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 05 |
| නැගෙනහිරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 7 හා 9 |
| දකුණට | : | දොන් කරෝලිස් සහ පුත්‍රයෝ හිමිකම් කියනු ලබන ඉඩම |
| බටහිරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 4 හා 5 |

06 - 572

1A - G 016135— 340 (2012/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.